

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391- 6785

තෙවන කාණ්ඩය, 1 සහ2 කලාප 2003


## <u>තේ ඉඩම්වල ගැටකොල පාලනය</u>

*<u>(TRI UPDATE - Vol: 7 No. 1 June 2002 - Management of "Getakola" A Weed in Tea - කේ.ජ්.ප්‍රේමතිලක සහ ඒ.ගමගේ ලිපියේ සිංහල පරිවර්තනය - පරිවර්තනය- හිරෝමි නිශාන්ති)</u>*

ගැටකොල වල් පැලෑටිය (කුලය: රැබියේසියේ, ඝණය හෙඩියෝටිස්) උඩරට, මැදරට තේ වගාවන් වල හා පහතරට ප්‍රදේශයේ ඇති සමහරක් තේ වගාවන් වල දැකිය හැක. මෙම වල් පැලෑටියේ, *Hedyotis nitida* Wight Arn, *Hedyotis fumuta* Alston සහ *Hedyotis rhinophylla* යන විශේෂයන් තේ වගාව තුල පැතිර් ඇත.

මෙම වල් පැලෑටියට විශේෂිතවූ රූපීය ලක්ෂණ හේතුවෙන්, විශේෂයෙන්ම වැඩුනු ගැටකොල පත්‍ර වල ඇති රළු ස්වභාවය නිසා දැනට භාවිතා කරන වල් නාශක මගින් මෙය පාලනය කිරීම අපහසුය. මෙම ශාකය තරමක කාෂ්ටීය ස්වභාවයකින් යුක්ත නිසා අතින් උදුරා දැමීම, දුෂ්කර සහ ශ්‍රමය වැය වන ක්‍රියාවකි. එනිසා තේ වගා කලාප තුනෙහිම, මෙහි පාලන ක්‍රම සොයා ගැනිම සඳහා පර්යේෂණ සිදුකර ඇත. මෙම පර්යේෂණයන් මූලික කරගෙන, ගැටකොල පාලනය සඳහා අත්හදා බැලීමේ වැඩ සටහනක් පහතින් සඳහන් කර ඇත.

| කාල වකවානුව | රසායනික සහ යාන්ත්‍රික ක්‍රම | කෘෂිකාර්මික/යාන්ත්‍රික සහ රසායනික ක්‍රම |
|---|---|---|
| ජනවාරි-පෙබ | ගැටකොල කපා දැමීම (පිහියකින් හෝ වයර් කැබැල්ලක් සවිකල තණකොල කපනයක් භාවිතයෙන්.) | ගැටකොල කපා දමා, මානා, ප්ලෙමින්ජියා, කැලියෙන්ඩ්‍රා, හෝ වල් සූරියකාන්ත වැනි දේ සමග එම ස්ථානයේම වසුනක් සේ යෙදීම. |
| අප්‍රේල් | හෙක්ටයාරයකට ග්ලයිෆොසේට් (රවුන්ඩ් අප්, 36% ae) ලී 2.5 - 3.0 + ඩයියුරොන් (80 wp) ක්‍රි.ග්‍රෑ 1.1 හෝ හෙක්ටයාරයකට ග්ලයිෆොසේට් (රවුන්ඩ් අප්, 36% ae) ලී.1.7 + දියකල හැකි ආකාරයෙන් වූ ඩයුරොන් (ඩයිරෙක්ස් 40% a.i.) ලී.1.0 ( එම ස්ථානයට පමනක් යොදන ලෙස) | මැයි: හෙක්ටයාරයකට ග්ලයිපොසේට් (රවුන්ඩ් අප්, 36% ae) ලී 1.7 - 2.8 + විසුරුම්කාරකයක් සමඟ හෝ පැරක්වට් (ග්‍රැමොක්සෝන්) ලී. 0.7-1.0 |
| ජුනි/ජූලි | හෙක්ටයාරයකට පැරකොට් (ග්‍රැමොක්සෝන්) ලී. 0.7-1 තනිව හෝ MCPA (60%) ලී. 1.2 සමඟ (ගිරාපලා, වැනි අනෙකුත් වල්පැල පාලනය සඳහා) | හෙක්ටයාරයකට ග්ලයිපොසේට් (රවුන්ඩ් අප්, 36% ae) ලී.2.5 - 3.0 + ඩයියුරොන් (80% wp) කි.ග්‍රෑ 1.1හෝ + ඩයියුරොන් 1.0 (එම ස්ථානයට පමනක් යොදන ලෙස) |
| අගෝ/සැප්. | කපා දැමීම හෝ හෙක්ටයාරයකට ග්ලූෆොසිනේට් ඇමෝනියම් (බැස්ටා, 15% a.i.) ලී. 1.5 හෝ හෙක්ටයාරයකට ග්ලයිෆොසේට් (රවුන්ඩ් අප්, 36% ae) ලී. 2.8 සහ ඇමෝනියම් සල්ෂේට් (0.4%) කි. ග්‍රෑ 2.2 ක් හෝ දියලුණු - සෝඩියම් ක්ලෝරයිඩ් (0.4) කි.ග්‍රෑ. 2.2 ක් හෝ ටීපෝල් ලී.1.0 ක් ජලය ලී.550 ක දියකර ඉසින්න. (එම ස්ථානයට පමනක් වන ලෙස) | සැප්/ඔක්: කපා දැමීම හෝ හෙක්ටයාරයකට MCPA (60%) ලීටර් 1.2 + පැරකොට් (ග්‍රැමොක්සෝන්) ලී. 0.7 - 1.1 |
| නොවැ/දෙසැ. | හෙක්ටයාරයකට 2.4 D (හෙඩනෝල් - D) (55% a.i.) ලී.1.2 + ඩයියුරොන් (80% WP) කි.ග්‍රෑ. . 1.4 (එම ස්ථානයන්ට පමනක් වන ලෙස) | හෙක්ට 2.4 D (හෙඩනෝල් - D) 55% a.i.) ලී.1.2 + ඩයියුරොන් (80% WP) කි.ග්‍රෑ. 1.4 (එම ස්ථානයන්ට පමනක් වන ලෙස) හෝ සල්පොසේට් (48% a.i.) ලීටර් 3.5. |



HEDYOTIS AURICULARIA

ගැටකොල